( 24 )

# ශ්‍රී ලංකාවේ තේ වගාවේ ඉතිහාසය හා ඒ ආශ්‍රිත කාර්මික උරුමය

එස් පී සී සේනාධීර
තෙවන වසර
chamalsenadeera24@gmail.com

**හැඳින්වීම**

මෑත කාලය වන තුරු ම මෙරට පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ බොහෝ විට පර්යේෂණ දියත් වූයේ පැරණි වෙහෙර විහාර හා නටඹුන් පදනම් කර ගනිමිනි. ශ්‍රී ලංකාවේ තේ වගාව හා වතුකරය හා සම්බන්ධ සංස්කෘතිය පිළිබඳ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක මානයකින් බැලීම මෙම ලිපියේ මූලික පරමාර්ථයයි. ලොව ප්‍රචලිතම පානය වන තේ සම්බන්ධයෙන් බොහෝ කෘතීන් හමුවන නමුත් මේවා හුදෙක් උද්භිත විද්‍යාත්මක ,ආර්ථිකමය, තේ වගා ක්‍රම, නිශ්පාදන ක්‍රම ආදී මාතෘකා ඔස්සේ රචනා වී තිබේ. නමුත් උක්ත ලිපිය තේ වගාවේ ඉතිහාසය හා ඒ හා බැඳි කාර්මික පුරාවිද්‍යා උරුමය පිළිබඳ සඳහන් කොට තිබේ.

**තේ වගාවේ ඉතිහාසය**

රාජ්‍ය අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්තය ආරම්භ වූයේ ක්‍රිස්තු වර්ෂ 1769 දී ලංදේසී ආණ්ඩුකාර ෆෑන්ක් යටතේ ය. 17 වන සියවසේ කුරුඳු ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝගය ලෙස ප්‍රචලිත ව පැවතියේ (ඊරියගම. 1997:22). එමෙන් ම මින් පසුව ඇරඹි කෝපි වගාව 1833 වන විට ක්‍රමයෙන් විනාශ වී තිබේ. මින් පසුව කොපි වගාව වෙනුවට තේ වගාව සඳහා භූමිය සකසා තිබේ (Weatherstone.1991:122). තේ ශාකයේ නිජබිම ලෙස හඳුනාගත හැක්කේ චීනයයි. චාපු (Chapu) නමැති චීන ලේඛකයාගේ වාර්තා වලට අනුව තේ පානය චීනයේ ආරම්භ වූයේ ක්‍රිස්තු වර්ෂ 6 වන සියවසේ සිට ය (පියසිරි, 1999:03). 1839 දී මුල් වරට තේ පැළය මෙරටට හඳුන්වා තිබේ. මෙසේ ශ්‍රී ලංකාවට මුල් වරට ඇසෑම් වර්ගයේ තේ හඳුන්වා දීමේ ගෞරවය හිමිවිය යුත්තේ ඉන්දියානු උද්භිත විද්‍යා විශේෂඥයෙකු වන ආචාර්ය වොලික්ට ය. පේරාදෙණිය උද්භිත උද්‍යානයේ දී මුල් වරට රොපණය කළ තේ වගාව නුවරඑළිය ප්‍රදේශයේ වගා කිරීමත් සමග ලාභ ඉපයීමේ වගාවක් ලෙස සීඝ්‍ර වශයෙන් ව්‍යාප්ත වීම සිදුවිය (Silva, 1978:36). කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට වාණිජ මට්ටමින් තේ වගා කිරීම සිදු කරන ලද්දේ 1867 වර්ෂයේ දී ජේම්ස් ටේලර් නමැති බ්‍රිතාන්‍ය ජාතිකයා විසිනි.

තේ ගසෙහි උද්භිද විද්‍යාත්මක නාමය කැමිලියා සිනෙන්සිස් (camellia senensis) වේ. මෙම ශාකය 3CM ට වඩා උසට වැඩෙන්නකි. සුදු පැහැති කුඩා මල් හටගන්නා අතර තේ ඇට ද තද කොළ පැහැයකින් ගසෙහි ඵලය ලෙස ඇති වේ.තේ වගාවේ දී මේ ගස

උස් ආකාරයට වර්ධනය වීමට ඉඩ නොතබන අතර එය පඳුරක ආකාරයට සකසයි. වඩාත් දළු ලබා ගැනීමේ පරමාර්ථයෙන් එසේ කරනු ලබයි. තේ පඳුරෙහි වර්ධනය පිණිස 1250පප අවම වර්ෂා පතනයක් අවශ්‍යය වේ. උෂ්ණත්වය මෙන් ම පින්න සහිත පරිසරයක් ද ඒ සඳහා සුදුසු පසක් තිබීම ද ඊට සුදුසු සාදක වේ. මුල් කාලයේ තේ පැළ සිටු වීමේදී, අක්කරයකට තේ පැළ 3000ක් පමණ වගා කෙරිණි. එහෙත් වර්තමානයේ ක්‍රමානුකූලව භූමියේ සමෝච්ච රේඛාවල විහිදීමට අනුකූලව තේ පැළ සිටුවීම සිදුකරනු ලබයි. ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය නිර්දේශ කර ඇති ආකාරයට තේ පැළ දෙකක් අතර පරතරය 0.6 පමන විය යුතුය. පේළි දෙකක් අතර පරතරය 1.2 පමණ විය යුතුය. මේ අනුව හෙක්ටයාරයකට තේ පැළ 13700 පමණ සිටුවිය හැකිය. එනම් අක්කරයකට පැළ 5500ක් පමණ වේ. මුල් කාලයේ ශ්‍රී ලංකාවේ පහතරට නිරිතදිග තෙත් කලාපීය තේ වතුවල හා උඩරට වතුකරයේ ද ඇට තේ මඟින් වගාව ව්‍යාප්ත විය. එහෙත් වර්තමානයේ පහතරට වතුකරයේ රිකිලි තේ වගාව වඩාත් ප්‍රචලිත වී තිබේ. කෙසේ වෙතත් මේ ක්‍රම දෙක ම භාවිත කරනු ලබයි.

**ශ්‍රමය ලබා ගැනීම**

වැඩවසම් ක්‍රමය 1832 වන විට සම්පූර්ණ වශයෙන් ම අවලංගු කරනු ලැබීය. මේ හේතුවෙන් වැවිලි කරුවන්ට තම වතුවල සේවයට කම්කරු ජනතාව අවශ්‍ය වේ (මුණසිංහ.2000:116). වතු වගාවේ දී බහුල වශයෙන් වර්තමානයේදී ලබාගන්නේ දමිළ ජනතාවගේ ශ්‍රමයයි. නමුත් අතීතයේ වතුකරය ව්‍යාප්ත වීමත් සමග ඇති වූ අසීරු වැඩ ක්‍රමයන් තුළින් සිංහලයන්ගේ උදාසීනත්වය දුරුකර ගැනීමට මග පෑදුණු බව ඇතමුන් අදහස් පළ කර තිබේ (Wesumperuma,1986(09). මෙමගින් පැහැදිලි වන්නේ තේ වගාව ආරම්භක සමයේ සිංහල ජනයාගේ ශ්‍රමය ලබා ගෙන ඇති බවයි.නමුත් පසු කාලීන ව තේ වගාව දියුණුවත්ම ඉන්දියානු කම්කරුවන් මෙරටට සංක්‍රමණය වී තිබේ. එමසන්ට් ටෙනන්ට් විසින් මෙකී ඉන්දියානු කුලී කරුවන්ගේ තත්ත්වය බටහිරදිග ඉන්දියානු දාසයන් හා සංසන්දනය කර තිබේ (බණ්ඩාරනායක.1990:205).

**තේ වගාව ආශ්‍රිත ඉදිකිරීම්**

තේ වගාවට අවශ්‍ය වූ දේශගුණික සාධක මෙන් ම ඒ සදහා සුදුසු පස කඳුකරයේ පහසුවෙන් හඳුනාගත හැකිවූ නිසා මෙම ප්‍රදේශ වල සීඝ්‍රයෙන් තේ වගාව ව්‍යාප්ත විය. මෙහි දී මේ ආශ්‍රිත ව වෙන ම සංස්කෘතියකට උරුමකම් කියන ගොඩනැගිලි සමූහයක් ඉදිවීම දැකගත හැක. තේ කර්මාන්තය හා සබැඳි මුල් ම ඉදිකිරීම වශයෙන් හඳුනාගත හැක්කේ මුල් කාලීන ව කෝපි වගාවට යොදා ගැනුණු ගබඩා ය. පසුකාලීන ව මේවා තේ කර්මාන්ත ශාලා බවට පත් වී තිබේ (Elliot&Whitehead.1990:125).

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට තේ නිශ්පාදනයට මුල් වූ ටේලර්ගේ නිවහන ඔහුගේ තේ කර්මාන්ත ශාලාව විය. මෙකී නිවස තේ නිවහන (Tea house) නමින් ද හඳුන්වයි. මෙකී නිවසේ ආලින්දය තේ නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගෙන තිබේ (Porrest.1967:72). මෙසේ කුඩා පරිමාණයෙන් ඇරඹි තේ කර්මාන්ත ශාලා පසුකාලීන ව ක්‍රමික වර්ධනයකට ලක් වීම හඳුනාගත

හැක. එමෙන් ම තේ වගාව ආශ්‍රිත ව අතීතයේ සිට වර්තමානය දක්වා ම හඳුනාගත හැකි ගොඩනැගිලි විශේෂයක් ලෙස පේළි නිවාස (Line) දැක්විය හැක. මෙම නිවාස වතු වගාව සඳහා යොදා ගැනුනේ දකුණු ඉන්දීය කුලී කරුවන්ට නවාතැන් සැපයීම සඳහා ඉදිකළ ඉදිකිරීමක් ලෙස හඳුනාගත හැක. මුල් කාලීන ව මෙම නිවාස තැනීම සඳහා භාවිතයට ගැනුණු අමුද්‍රව්‍ය වූයේ මැටි හා දැව මාධ්‍යයයි (Elliot&Whitehead.1990(196). මෙසේ මුල් කාලීන ව ඓන්ද්‍රීය ද්‍රව්‍ය වලින් සැකසූ මෙම නිවාස පසුකාලීන ව කළුගල්, හුණුගල්, හුණු බාදාම සහ දැව යොදා ගෙන තිබේ. වතු වගාව ආශ්‍රිතව මෙම පේළි නිවාස ක්‍රම කිහිපයක හඳුනාගත හැක.

- තනිපේළි නිවාස (Single row lines)
- එකිනකට පිහිටා ඇති නිවාස (Old back to back lines)
- ද්විත්ව නිවාස (Twin cottage)

වර්තමානයේ ඉදිවන පේළි නිවාස ද්විත්ව නිවාස ක්‍රමයට ඉදිකරනු ලබන අතර පැරණි පේළි නිවාස ප්‍රතිසංස්කරණය කරමින් භාවිත කරන අවස්ථා ද හඳුනාගත හැක. එමෙන් ම වතුකරය ආශ්‍රිත ව බ්‍රිතාන්‍ය වැවිලිකරුවන්ටත් සිංහල හා දෙමළ නිලධාරීන්ටත් කම්කරුවන්ටත් ආගමික කර්තව්‍යයන් ඉටුකර ගැනීම සඳහා දක්වන ලද අනුග්‍රහයක් ලෙසට ඉදිවූ වාස්තු විද්‍යාත්මක අංග ලෙස පන්සල්, පල්ලි හා කෝවිල් අතීතයේ සිට ම හඳුනාගත හැක.

**වැවිලිකරුවන්ගේ ඉතිහාසය**

කෝපි හා තේ වගාව ආරම්භ වූ සමයේ කඳුකර ප්‍රදේශවල පිහිටි වනාන්තර හෙළිපෙහෙළි කිරීමට වැවිලි කරුවන්ට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදු විය. මෙරටට පැමිණි මුල් ම වැවිලිකරුවන් අක්කරයට සිලිං 5 බැගින් ගෙවා අක්කර විශාල ප්‍රමාණයක ඉඩම් අත්පත් කොට ගෙන තිබේ (Weatherstone,1991(146). මෙම වැවිලිකරුවන්ට අවශ්‍ය නිවාස මුල්කාලීන ව කොළ අතු භාවිතයෙන් ඉදි කොට තිබූ බව බොහෝ විචාරකයන්ගේ මතයයි. මේජර් ස්කිනර් මහතා ද මේ බව වාර්තා කර තිබේ. එමෙන් ම මුල් කාලීන ව ඉතා දුෂ්කර ආකාරයට දවස ගෙවූ මෙම වැවිලිකරුවන්ට ඉතා බිහිසුණු අභියෝග වලට පවා මුහුණ දීමට සිදුව තිබේ. එම්.ජේ.බ්‍රේමර් මහතා විසින් තමා වැවිලිකරුවෙක් ව සිටි සමයේ එනම් 1875 දී පමණ දිවියෙකු සිය වත්තට පැමිණි ආකාරය වාර්තා කොට තිබේ (Weatherstone,1991(166). එමෙන් ම වැවිලි ප්‍රදේශ පුළුල්වත් ම සහකරුවන්ගේ අවශ්‍යතාවය ද පැණනැගුණි. මුලින් සඳහන් කළ ජේම්ස් ටේලර් මහතා ද තම වැටුප් දිවිය අරඹා ඇත්තේ සහය වැවිලිකරුවෙකු ලෙසිනි. 1882 ලන්ඩනයේ පළ වූ පුවත්පතක වතු සහයකවරයෙකුගේ මුල් අවුරුද්ද තුළ වැටුප පවුම් 120 ක් ද දෙවන අවුරුද්දේ දී එය පවුම් 180 දක්වා ද වැඩි වූ බව සඳහන් කර තිබේ (රසාංගිකා.2005:274). අතීතයේ විසූ විවිධ වැවිලිකරුවන් සෑම ක්ෂේත්‍රයක ම දක්ෂයන් වූ බව විචාරක මතයයි. මොවුන් ගොවියන්, වෙළෙඳුන්, ඉංජිනේරුවන්, ස්වභාවික විද්‍යාඥයින්, වෛද්‍යවරුන් යන සෑම ක්ෂේත්‍රයක ම නියලී තිබේ.

**කාර්මික පුරාවිද්‍යාව**

කාර්මික පුරාවිද්‍යාව නමැති විෂය ක්ෂේත්‍රයට මූලික අඩිතාලම දමන ලද්දේ මයිකල් රික්ස් නම් බ්‍රිතාන්‍ය ජාතිකයා විසිනි. එනම් ඔහු විසින් AMATURE HISTORIAN නම් සඟරාවට දෙවන ලෝක සංග්‍රාමයේදී කාර්මික විප්ලවයට අයිති ස්මාරක ආරක්ෂා කරගැනීමට ලියන ලද ලිපිය පසුබිම් කොට ගනිමිනි. කාර්මික පුරාවිද්‍යාව මගින් මානව ඉතිහාසයේ සියළුම තාක්ෂණික ප්‍රවණතා අදහස් වන බව ඇතැම් විචාරක මතයයි. නමුත් මේ ගණයෙහි ලා සැළකෙන්නේ කාර්මික විප්ලවයෙන් පසු කොටසයි. එනම් කාර්මික පුරාවිද්‍යාවේදී සිදුවන්නේ නුදුරු අතීතයට අයත් සන්නිවේදනය, තාක්ෂණය වැනි කරුණු අධ්‍යයනය කිරීමයි. මෙහි දී මූලික වශයෙන් ම ද්‍රව්‍යාත්මක සංස්කෘතිය (Material culture) අධ්‍යයනය කිරීමයි. මෙහි දී යටත් විජිත සමයේ මෙරට නිර්මාණය වූ දුම්රිය මාර්ග මෙන් ම වැවිලි කර්මාන්තය ආශ්‍රිත ගොඩනැගුණු කාර්මික නිමැවුම් කාර්මික උරුමය වශයෙන් හඳුනාගත හැක. මුලින් ම දුම්රිය මාර්ග ඉදිවීම සිදුව තිබෙන්නේ තේ හා කෝපි වගාව පාදක කොට ගනිමිනි (පෙරේරා.1925:267). තේ වගාව සඳහා වන කාර්මික උරුමය වෙන ම හඳුනාගත හැකි ය. මෙහි දී තේ සැකසුම් ක්‍රියාවලියේදී ආරම්භයේ පටන් භාවිතයට ගැණුනු යන්ත්‍ර සූත්‍ර අධ්‍යයනය කළ හැක.

**තේ දළු ඇඹරීම සඳහා යොදාගත් යන්ත්‍ර.**

1 මුල් කාලීන තේ ඇඹරුම් ක්‍රම.

මුල් කාලීන ව ලෝකයේ තේ නිපදවීමේ ආරම්භක රට වන චීනයේ, තේ දළු ඇඹරීම සිදු කරනු ලැබුවේ බැග්වලට දමා පෑගීමට ලක් කිරීමෙනි. එවිට මේ දළු එකම කැටියක් ලෙසට ලැබී ඇති අතර ඒවා කොළ තේ ලෙසට නිෂ්පාදනය විය. ඉන් පසුව මේ රටවල අතින් තේ දළු පොඩි කිරිමේ ක්‍රමය ඇති විය. ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය ද ඇරඹියේ මේ ආකාරයට අඹරා ගනු ලැබූ දළු මගිනි. එය මුලින් ම සිදුකරනු ලැබුයේ, ලංකාවේ මුල් වැවිලිකරුවෙකු වන ජේම්ස් ටේලර් ය. වරක් උතුරු ඉන්දියානු වැවිලිකරුවෙකු වූ නොබෙල්ගෙන් මොහු තේ දළු නෙළන ආකාරය හා ඇඹරිම සම්බන්ධ කරුණු අවබෝධ කරගත්තේ ය. නොබෙල්ගේ තේ ඇඹරීමේ ක්‍රමය වූයේ, අත උපකාරී කර ගැනීමයි. මේස මත අතෙහි මැණික් කටුවේ සිට වැලමිට දක්වා වූ කොටස උපයෝගී කර ගනිමින් දළු ඇඹරීම සිදුකිරිම මෙම ක්‍රමයයි. පහතරට ප්‍රදේශවල මේ සඳහා දළු බෑග් වංගෙඩි තුළ දමා කෙටීමට ලක් කර ඇති බවට ද කරුණු අනාවරණය වේ.

**දියුණු තාක්‍ෂණික යන්ත්‍ර භාවිතය**

ලොව මුල් ම ඇඹරුම් යන්ත්‍රය තේ කර්මාන්තය සඳහා හඳුන්වා දෙනු ලැබූයේ උතුරුඉන්දියාවට යි. ඒ 1860 දී ය. මෙම තේ ඇඹරුම් යන්ත්‍රය මේසයක ස්වරූපය ගෙන තිබේ. මෙය නෙල්සන් නමින් හඳුන්වනු ලැබ තිබේ. මෙහි ස්වභාවය පිළිබඳ විස්තර කළහොත්, දිගු මේසයක් සහිත ගමන් කරවන මිටක් සහිත වූවක් විය. එමඟින් ඉදිරියට හා පිටුපසට මෙය චලනය කළ හැකිය. ඊට අමතරව සතරැස් මේස දෙකක් ද මෙයට සම්බන්ධ කර ඇත. එය ඊට

යටින් වූ එහාමෙහා කළ හැකි මේසයට සම්බන්ධ කර ඇත. මෙහි චලනය අඩු වැඩි කිරීම කම්කරුවෙකු විසින් සිදු කළ යුතු ය. මෙහි විශේෂත්වය නම්, මැල වූ තේ දළු කැන්වස් මළුවල දමා මේ යන්ත්‍රයට දැමීමයි. මෙහිදී, බෑගය සමඟ මළු ඇඹරෙන අතර කම්කරුවා එය ක්‍රියාත්මක කළ යුතු ය.

මේ ආකාරයට ලෝකයේ තේ නිපදවන රටවල ඇඹරුම් යන්ත්‍රයේ ආරම්භය සිදු වී ඇති අතර, ශ්‍රී ලංකාවට මුල්ම තේ ඇඹරුම් යන්ත්‍රය හඳුන්වා දීමේ ගෞරවය ජේම්ස් ටේලර්ට හිමිවිය යුතුය. වර්ෂ 1873 ජනවාරි මස ටේලර් විසින් මෙකී යන්ත්‍රය මඟින් මසකට සරිලන තේ ප්‍රමාණයක් නිපදවා තිබේ. එය ඔහු ලැබූ ජයග්‍රහනයක් පමණක් නොව සමස්ත ශ්‍රී ලාංකේය ජනතාව ම ලැබූ ජයග්‍රහනයක් ලෙස සැළකීමට පුළුවන. ජේම්ස් ටේලර් වූ කලී සියලු දෙයෙහි දක්ෂ ස්වභාවික විද්‍යාඥයෙකු, වැවිලිකරුවෙකු, ඉංජිනේරුවෙකු පමණක් නොව ක්ෂේත්‍රයේ දී නො පසුබට ව තමන් නොදත් දේ ඉගෙනීමට රුචි වූ නිහතමානි පුද්ගලයෙකු ලෙස හැඳින්වීමට පුළුවන.

මේ ආකාරයට බිහි වූ ඇඹරුම් යන්ත්‍රය ක්‍රමයෙන් වර්ධනය වීමෙන් පසුව ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සඳහා විවිධ පන්නයේ ඇඹරුම් යන්ත්‍ර භාවිත කරනු ලැබිණි. තේ දළු ඇඹරීම සඳහා වර්තමානයේ ප්‍රධාන ක්‍රම දෙකක් භාවිත කරයි. ඒවා නම්,

1. ඕතෝඩොක්ස් ක්‍රමය
2. රොටවේන් ක්‍රමය නම් වේ.

**ඕතෝඩොක්ස් ක්‍රමය**

මේ ඇඹරුම් යන්ත්‍රය මේසය මත කරකැවෙමින් ක්‍රියාත්මක වේ. මෙකී මේසය වෘත්තාකාර විශාල යකඩ පට්ටමකට කිතුල් ලී උපයෝගී කර ගෙන නිපදවා තිබේ. වක්‍රාකාරව ඇති මෙහි කිතුල් ලීයෙන් ම පන්නා කේන්ද්‍රයේ සිට දාරයට විහිදෙන පරිදි කළ වක්‍ර පැන්නුම් රේඛා ඇත. මේවා මත පීඩන පියන මඟින් ඇති කරනු ලබන තෙරපීම හා භ්‍රමනය හේතුවෙන් දළු කොටස්වලට කැඩීම සිදු වේ. පීඩන පියනෙහි පීඩනය අඩු වැඩි කිරීමට බර යෙදීම සඳහා වෙනම අංගයක් තිබෙන අතර එය පුද්ගලයෙකු විසින් ක්‍රියාත්මක කළ යුතු වේ. මෙකී බර ප්‍රමාණ මත විවිධ ඇඹරුම් යන්ත්‍ර මඟින් තේ දළු කුඩු වීම, විවිධ ප්‍රමාණවලට සිදු කෙරේ. මෙහි දළු දමන විවරය, පීඩන පියන, කුටීරය, ඇඹරුම් මේසය, ඇඹරුම් මේසයේ මධ්‍ය කොටස හා කුඩු පිට කරන දොරටුව වශයෙන් කොටස් දැකිය හැකි ය. මේ ඇඹරුම් යන්ත්‍රය වෙතට දළු එවීම සඳහා උඩු මහලේ සිට සුදු දිග පටියක් යොදා තිබේ. වරකට දළු කි.ග්‍රෑ.225-500 ත් අතර ප්‍රමාණයක් එක් ඇඹරුම් යන්ත්‍රයක් වෙත ලබා දෙයි. මේ කොටසේ කාල වේලාව සටහන් කිරීමේ පුවරුවක් ද තිබේ. ඒ මේවා නියමිත කාල සීමාවන් යටතේ සිදු කෙරෙන හෙයිනි.



රොටවේන් ඇඹරුම් යන්ත්‍රය.

1967 දී මේ ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබීය. ඉතා තියුණු දැති, පංකා පෙති ආදි කොටස් මඟින් හා දිගු මිටිකින් යුතු මෙයින් දළු ඇඹරීම සිදුවෙයි. ball breaker නම් කොටසක් මේ යන්ත්‍රයේ ඉදිරිපසින් සම්බන්ධ වී ඇත. එකට කැටි ගැසී ගුලි ලෙසින් පිටවන තේ කොටස් කුඩු බවට පත් කිරීම මෙයින් සිදු වේ. මේ ආකාරයේ නවීන ඇඹරුම් යන්ත්‍ර රැසක් වර්තමානයේ තේ කර්මාන්ත ශාලාවල භාවිත වේ. මේවා විවිධ සමාගම් මඟින් නිපදවන ලද ඒවා වේ. මේවා යකඩ හා දැවයෙන් නිපදවා ඇත.

මීට අමතර ව, හන්තාන තේ කෞතුකාගාරයේ ඇති තේ ඇඹරුම් යන්ත්‍ර කිහිපයක් පිළිබඳ ව විමසීය යුතුය. එහි විවිධ සමාගම් නාම යටතේ ඇඹරුම් යන්ත්‍ර කිහිපයක් හඳුනාගත හැකිය.





28'' එකොනොමිකල් රෝල.

**හන්තාන තේ කෞතුකාගාරයේ ඇඹරුම් යන්ත්‍ර.**




මාෂල් තේ ඇඹරුම් රෝල

1. 36" මාෂල් රෝල තේ ඇඹරුම් රෝල.

මාෂල් ඇන්ඩ් සන්ස් කොම්පැණි ලිමිටඩ් මඟින් 1920 දී මෙය නිෂ්පාදනය කර ඇත. මෙම යන්ත්‍රයෙන් මැළ වූ දළු රාත්තල් 375ක් ඇඹරීමේ හැකියාව පවතී. ද්විත්ව ක්‍රියාකාරී, අශ්ව බල 6-8වන අතර, වේගය පරිභ්‍රමණ වේගය පැ.මි. 70 කි. යන්ත්‍රයේ රෝදයේ විෂ්කම්භය අඟල් 24කි.

යෂ්ටියේ රෝදයේ විෂ්කම්භය අඟල් 14 කි. යෂ්ටියේ වේගය මී. පරිභ්‍රමණ වේගය 120කි. මාර්ෂල් කොම්පැණිය මගින් නිෂ්පාදනය කළ මුල් යන්ත්‍රයක් ලෙස මෙය හැඳින්වීමට පුළුවන. මෙම යන්ත්‍රයේ ඉතා විශාල අකුරුවලින් එම සමාගමේ නාමය (MARSHALL) යොදා ඇති අතර, දැවයෙන් හා යකඩ භාවිතයෙන් මෙම යන්ත්‍රය සාදා ඇත.

2. 28'' එකොනොමිකල් රෝල.

මෙම යන්ත්‍රයට තනි ක්‍රියාකාරී රවුම් ජැකැට්ටුව සහිතය. මෙය ක්‍රියාත්මක කිරිමට අශ්ව බල 3-4 ක් අවශ්‍ය වේ. මෙහි ඇඹරිය හැකි උපරිම ධාරිතාව මැළ වූ දළු රාත්තල් 250 කි. මෙය 1890 නිෂ්පාදිත ය. මෙය දෙවැනි රෝල ලෙස භාවිත කර ඇත. යන්ත්‍රයේ රෝදයේ විෂ්කම්භය අඟල් 23.5 කි. යෂ්ටි රෝදයේ විෂ්කම්භය අඟල් 20 කි. යෂ්ටියේ වේගය පරිභ්‍රමන වේගය පැ.මි. 120 කි. රෝලයේ බර රාත්තල් 4256 කි.

**3. ජැක්සන් 28'' ඉකොනොමිකල් රෝල.**



මෙම යන්ත්‍රය අටපට්ටම් හැඩැති, තනි ක්‍රියාකාරී ය. මෙය ක්‍රියාකිරිමට අවශ්‍ය අශ්ව බල ගණන 2-3කි. මෙහි ඇඹරිය හැකි උපරිම තේ දළු ප්‍රමාණය රාත්තල් 150 කි. තුන් වන රෝල ලෙස භාවිත කර ඇත. තේ දළු ඇඹරීමේ කාලය මිනිත්තු 30 කි. මෙහි යෙදවෙන සම්පූර්ණ පීඩනය මි.7 කි. යන්ත්‍රයේ රෝදයේ විෂ්කම්භය අඟල් 21 කි. යෂ්ටියේ රෝදයේ විෂ්කම්භය අඟල් 14.8 කි. යෂ්ටියේ පරිභ්‍රමණ වේගය පැ.මී.120 කි. රෝලයේ බර රාත්තල් 2128 කි. මෙම යන්ත්‍රය නිෂ්පාදනය කර ඇත්තේ, 1890 ය. මෙම යන්ත්‍ර ද නිෂ්පාදනය කර ඇත්තේ, මාර්ෂල් හා සන්ස් සමාගමයි. මෙම සමාගම එන්ගලන්තයේ ගින්ස්බොරො ප්‍රදේශයේ පිහිටියකි. මෙය ආරම්භ කර ඇත්තේ, 1812 වර්ෂයේ දී ය. මෙම ආයතනය මගින් මුලින් ම යන්ත්‍රයක් නිපදවා ඇත්තේ, 1920 දීය. ඒ ඉන්දීයාවට තේ ඇඹරුම් යන්ත්‍රයක් ඕනෑ වූ නිසා ය. මේ ආයතනය තවමත් තේ යන්ත්‍ර නිෂ්පාදනයේ මෙන් ම නොයෙකුත් යන්ත්‍ර නිෂ්පාදනයේ මුල් තැන හිමි කර ගෙන සිටියි.

**සමාලෝචනය**

තේ වගාවට පෙර මෙරට ආර්ථික වැවිලි භෝගය කෝපි වගාවයි. පසුකාලීනය ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ආර්ථික ස්ථාවරත්වයකට පත්වීම සිදුවන්නේ ජේම්ස් ටේලර් මහතාගේ මැදිහත් වීමෙනි. එමෙන් ම මුල් කාලීනව වතු වගාවට ශ්‍රමය ලබාගෙන ඇත්තේ සිංහල ජනතාවගෙනි. 1832 රාජකාරී ක්‍රමය අහෝසි වීමත් සමග මෙය වෙනස් ව ද්‍රවිඩ කම්කරුවන් මෙරටට සංක්‍රමණය විය. වැඩවසම් ආර්ථික ක්‍රමය ආනයන අපනයන ආර්ථික ක්‍රමයකට පරිවර්තනය වීමත් සමග මහාමාර්ග ඉදිවීම, දුම්රිය මාර්ග ඉදිවීම, සන්නිවේදනය වැනි ක්ෂේත්‍ර වල දියුණුවක් ඇති විය. එමෙන් ම තේ වගාවේ ක්‍රමික දියුණුවත් සමග විවිධ වර්ගයේ යන්ත්‍ර

සූත්‍ර කරළියට පැමිණි අතර මේවා කාර්මික උරුමය ලෙස හඳුනාගත හැක. අවසන් වශයෙන් වතු වගා ක්‍රමය සමඟ ඇරඹි වතු සංස්කෘතිය නමැති සංකල්පය ප්‍රධාන සංස්කෘතියකට ඇතුළත් උප සංස්කෘතියක් ලෙස කැපී පෙනෙයි. මෙම උප සංස්කෘතිය ඇති කිරීමට පුරෝගාමී වූයේ බ්‍රිතාන්‍ය ජාතිකයින් ය. වර්තමානය වනතෙක් ම මෙම උප සංස්කෘතික ලක්ෂණ පැහැදිලි ව ම වතුකරයේ ජනයාගෙන් හඳුනාගත හැකි ය. එම නිසා තේ කර්මාන්තයේ නියැලෙන්නන්ගේ මානවවංශ විද්‍යාත්මක සාධක මෙන් ම ද්‍රව්‍යාත්මක සාධකයන්හි ද කැපී පෙනෙන වෙනසක් දක්නට ලැබේ.

**ආශ්‍රේය මූලාශ්‍ර හා ලිපි නාමාවලිය**


ද සිල්වා.ආර්, ***ශ්‍රී ලංකාවේ තේ ඉතිහාසය***, 2005, සමන්ති පොත් ප්‍රකාශකයෝ,කොළඹ

පියසිරි.ඒ.වයි, ***තේ කහට බිඳක සුළමුළ,*** 1999, තරංග ප්‍රින්ටර්ස්

ඊරියගම.ටී, ***ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය***, 1997, ජාතික අධ්‍යාපන පදනම

මුණසිංහ.අයි, ***ශ්‍රී ලංකාවේ මාර්ග ප්‍රවාහනය***, 2000, කර්තෘ ප්‍රකාශනයකි

De silva.G.P.S.H, ***Nuwaraeliya***, 1978, Department of information

Weatherstone'J, ***The early British tea and coffee planters and their way of life***, 1991

Wesumperuma'D.D, ***Indian immigrant plantation workers in sri lanka*** , 1986, sri lanka national library service board